www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ ආන්ඩුව වාමාංශිකයන් තිදෙනෙකු රඳවා තබා ගැනීම රාජ්‍ය මර්දනයේ නව වටයක් සංඥා කරයි

## Detention of three leftists by Sri Lankan government signals new round of state repression

**සමාජවාදී සමානතා පක්ෂයේ (ශ්‍රී ලංකාව) ප්‍රකාශය**

**2007 මාර්තු 12**

පසු ගිය මාසයේ ශ්‍රී ලංකාවේ ආන්ඩුව වාමාංශිකයන් තිදෙනෙකු අත් අඩංගුවට ගෙන රඳවා ගැනීමත් ඉන් පසුව තවත් කම්කරුවන් හා තරුනයක් සියයකට අධික පිරිසක් අත් අඩංගුවට ගැනීමත් කම්කරු පන්තියට එරෙහිව විවෘත රාජ්‍ය මර්දනයක් සඳහා වන සූදානමක් බව සමාජවාදී සමානතා පක්ෂය (සසප) අනතුරු අඟවයි. දෙමල ඊලම් විමුක්ති කොටි සංවිධානයට (එල්ටීටීඊ) එරෙහිව ගෙන යන ගැඹුරින්ම මහජන විරෝධයට ලක්ව ඇති සිය යුද්ධය උත්සන්න කරන තතු යටතේ රාජපක්ෂ ආන්ඩුව උත්සාහ කරන්නේ යුද්ධයේ ආර්ථික බර දැරීමට බල කෙරෙන සාමාන්‍ය වැඩ කරන ජනතාව අතරින් මතු වන විරුද්ධත්වය බිය ගන්වා මැඩීමට යි.

මිලිටරිය පෙබරවාරි 5 දා තිදෙනා අල්ලා ගත්තේ ය. පරිගනක අක්ෂර සංයෝජකයකු වන නිහාල් සේරසිංහ මැද කොලඹ දී පැහැර ගන්නා ලදි. ලලිත් සෙනෙවිරත්න එදින ම රාත්‍රියේ සන්නද්ධ පුද්ගලයන් විසින් ඔහුගේ නිවසින් ඇද ගෙන යනු ලැබූ අතර එම රාත්‍රියේ ම ඊට පසුව දුම්රිය කම්කරුවකු වන සිසිර ප්‍රියංකර කොලඹ දෙමටගොඩ ප්‍රධාන දුම්රිය සංකීර්නයේ ගේට්ටුව අසල දී අත් අඩංගුවට ගැනුනි. මෙම තිදෙනා, මීට දශකයකට පමන ඉහත දී පිහිටුවන ලද වෘත්තීය සමිතියක් වන දුම්රිය කම්කරු එකතුව විසින් මාස දෙකකට වරක් පල කෙරුනු අකුන පුවත්පත නිෂ්පාදනය කිරීමෙහි නිරතව සිටියහ.

පැහැර ගැනීම්වලට විරෝධය පල කරමින් දුම්රිය කම්කරුවන් හා මාධ්‍යවේදීන් සිය ගනනක් පෙබරවාරි 6 දා කොලඹ දී උද්ඝෝෂනයක් පැවැත්වූ අතර වෘත්තීය සමිති ගනනාවක් ම වර්ජන ක්‍රියා මාර්ගයක් ගන්නා බවට ද තර්ජනය කලහ. මිලිටරි බලධාරීන් මුලින් කියා සිටියේ මෙම පුද්ගලයන් තිදෙනා පිලිබඳ කිසිවක් තමන් නොදන්නා බව යි. කෙසේ වෙතත්, පෙබරවාරි 6 දා රාත්‍රියේ ආරක්ෂක අමාත්‍යංශය සිය වෙබ් අඩවියේ ප්‍රකාශයක් පල කරමින් "එල්ටීටීඊ සැකකරුවන්" තිදෙනෙකු මිලිටරි අත් අඩංගුවේ සිටින බව පිලිගත්තේ ය.

කිලිනොච්චියේ එල්ටීටීඊ කඳවුරුවල දී තමන් මිලිටරි පුහුනුව ලැබූ බවට සැකකරුවන් පාපොච්චාරනය කර ඇති බව ද එම ප්‍රකාශය නිවේදනය කලේ ය. අධි බලැති පුපුරන ද්‍රව්‍ය, ස්වයංක්‍රීය තුවක්කු, ක්ලේමෝර් බෝම්බ සහ බෝම්බ පිපිරවීමේ විද්‍යුත් උපකරන ඇතුලු "කොලඹ ස්ථාන ගනනාවක සඟවා තිබූ ආයුධ තොග සොයා" ගත් බව ද මිලිටරිය කියා පෑවේ ය.

පසු දින පැවති ප්‍රවෘත්ති සාකච්ඡාවක දී, ආන්ඩුවේ හා මිලිටරියේ ජ්‍යෙෂ්ඨ ප්‍රකාශකයෝ, "පාපොච්චාරන" වල වීඩියෝ පට පෙන් වූ අතර 2004 අග දී හා 2005 මුල දී තමන් දෙවරක් එල්ටීටීඊ පාලන ප්‍රදේශවල සංචාරය කල බව අත් අඩංගුවේ පසු වන තිදෙනා එම ප්‍රකාශවල දී පිලිගත්තේ ය. එම කටයුතුවලට සම්බන්ධ වූ සෙසු පුද්ගලයන් ද නම් කල ඔවුහු කොලඹ හා වෙනත් ප්‍රදේශවල බෝම්බ ප්‍රහාර සංවිධානය කල බවටත් අනාගතයේ දී තවත් ප්‍රහාර සැලසුම් කිරීමේ යෙදී සිටි බවටත් පාපොච්චාරනය කලහ. එල්ටීටීඊයේ සහයෝගය ඇතිව ශ්‍රී ලංකාවේ දකුනේ විප්ලවයක් සිදු කරනු පිනිස "විප්ලවකාරී විමුක්ති ව්‍යාපාරය" සංවිධානය කිරීමෙහි තමන් නිමග්න වූ බව ද ඔවුහු ප්‍රකාශ කලහ.

මෙම "පාපොච්චාරන" සම්බන්ධයෙන් පිලිතුරු නොසැපයුනු ප්‍රශ්න බොහොමයක් තවමත් පවතී. රටේ බල පවත්වන ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත (පීටීඒ) නම් වූ රුදුරු නීතිය යටතේ සේරසිංහ, සෙනෙවිරත්න හා ප්‍රියංකර කිසිදු චෝදනාවකින් හෝ නීතිඥයන්ට, පවුල්වල සාමාජිකයන්ට හා මාධ්‍යවලට මනා ප්‍රවිෂ්ඨයකින් තොරව රඳවා ගෙන සිටී. මේ තිදෙනා අවසානයේ මාර්තු 7 දා මහේස්ත්‍රාත් අධිකරනයක් හමුවට ගෙන එන ලදි. එහෙත් කිසිවකුට කතා කිරීමට ඔවුන්ට අවසර නොදුනි. පවුලේ සාමාජිකයන්ට රැඳවියන් හමුවීමට ඉඩ දෙන්නේ සතියකට එක් වතාවක් පමනි, ඒත් පොලිස් නිලධාරීන් ඉදිරියේ දී ය.

පාපොච්චාරන සම්බන්ධයෙන් පවත්නා වඩාත්ම සිත් කාවදින ලක්ෂනය නම්, ප්‍රවෘත්ති සාකච්ඡාවක දී යොදා ගත හැකි සුවිශේෂී තොරතුරු ආන්ඩුවට හා මිලිටරිය ලබා දෙමින්, පැය 48කට වඩා අඩු කලක දී ඒවා ලබා ගැනීම යි. රඳවා ගැනීම් බොහෝ සංඛ්‍යාවක් සිදු කර ඇති නමුදු ඉන් මොන යම් හෝ එකක් සම්බන්ධයෙන් හෝ මෙලෙස ප්‍රවෘත්ති සාකච්ඡාවක් පවත්වන ලද්දේ මේ ප්‍රථම වතාවට යි. මේ ගැන කල හැකි පැහැදිලි කිරීම් ඇත්තේ තුනක් පමනි: රැඳවියන් වධ බන්ධනයන්ට ලක් කිරීම මගින් පාපොච්චාරන ලබා ගෙන ඇත, නැතහොත් ඒවා ප්‍රකෝපකාරී ඒජන්තයන්ගේ පාපොච්චාරන ය, නැති නම් ඉහත දෙවර්ගයේ ම සංයෝජනයකි. ශ්‍රී ලංකාවේ දිග්ගැසුනු සිවිල් යුද්ධය තුල දී, මිලිටරි ඔත්තු සේවා හා විවිධ පොලිස් ඒජන්සි මෙම සියලුම විධි ක්‍රම මැනවින් ප්‍රගුන කර ඇත.

සියලුම රැඳවියන් "කොටි ත්‍රස්තවාදීන්" බවට පමනක් නොව, තමන්ගේ විවේචකයන් "සතුරාගේ ආධාරකරුවන්" බවට ද ආන්ඩුව අවධාරනය කරයි. "ත්‍රස්තවාදයට ගැති මාධ්‍ය මැර නඩ සහ එල්ටීටීඊයේ ලේ සල්ලි මත යැපෙන සෙසු ශ්‍රී ලංකා විරෝධී ව්‍යාපාර" ලෙස පෙබරවාරි 6 විරෝධතාවට සහභාගි වූ අයට පහර ගසන ආරක්ෂක අමාත්‍යාංශයේ ප්‍රකාශනයක් තුල ආන්ඩුවේ ආස්ථානයේ පවත්නා වර්ගෝත්තමවාදී ස්වභාවය එලිදරව් විය.

ඊට සමාන ආකාරයකින් ම ජනතා විමුක්ති පෙරමුනේ (ජවිපෙ) සහ ජාතික හෙල උරුමයේ සිංහල අන්තවාදීන් මෙම රැඳවියන් තිදෙනා "සිංහල කොටි", එනම් එල්ටීටීඊයට සම්බන්ධිත සිංහලයන්, ලෙස හෙලා දැක තිබේ. මෙය වනාහි ආන්ඩුවේ යුද්ධයට විරුද්ධ වන ඕනෑම අයෙකුට නිරන්තරයෙන් දමා ගැසෙන අපහාසාත්මක පදයකි. ජවිපෙ "පාපොච්චාරන" වල කොටස් සිය ලංකා පුවත්පතේ පල කලේ ය. ඒ හා බැඳුනු ලිපියක් තව දුරටත් අත් අඩංගුවට ගැනීම් සිදු කරන ලෙස ඉල්ලා සිටියේ මෙසේ ප්‍රකාශ කරමිනි: "තවත් පිරිසක් ඉදිරියේ දී අත් අඩංගුවට ගැනීමට නියමිත බව ආරක්ෂක අංශ පවසයි. මේ අතර රාජ්‍ය නොවන සංවිධාන ප්‍රධානීන්, මාධ්‍යවේදීන් යැයි කියා ගන්නා නිදහස් මාධ්‍යවේදීන් හා එන්ජීඕ වාමාංශිකයන් ද වන බව කියැවේ."

දැන් රාජපක්ෂගේ කැබිනට් මන්ඩලයේ සාමාජිකයකු වන හෙල උරුමයේ නායක චම්පික රනවක තව තවත් ප්‍රජාතන්ත්‍ර විරෝධී පියවර ගන්නා ලෙසත් යුද්ධයට විරුද්ධ වන ඕනෑම අයෙකු නැති භංග කර දමන ලෙසත් ඉල්ලා සිටිමින් දුෂ්ට සහගත ප්‍රකාශයක් නිකුත් කර ඇත. මුන්ව (යුද්ධයට විරුද්ධ වන අය) ඉතුරු කරන්නද ඔහේලා අපට කියන්නේ? මුන් ජාතිද්‍රෝහියො. මේ රටේ තියෙන වල්බුරු නිදහස නිසා තමයි මොකවත් කරන්න බැරී. ඔය කියන නීතිවලින් මේ ජාතිද්‍රෝහියෝ මට්ටු කරන්න බැරි නම් පුලුවන් විදිහට අපි ඒක කරන්න දන්නවා." යැයි ඔහු රාවය පුවත් පතට පැවසී ය.

## මර්දනය උත්සන්න කිරීම

ආරක්ෂක හමුදාවන් විශේෂයෙන් ම වතුකරයේ කම්කරුවන් හා තරුනයන් ඉලක්ක කරනු පිනිස සේරසිංහගේ, සෙනෙවිරත්නගේ හා ප්‍රියංකරගේ පාපොච්චාරන දැනටමත් යොදා ගෙන ඇත. තමන් සමග "සම්බන්ධකම් පැවැත් වූ අය" පෙන්වීම පිනිස සේරසිංහ දිවයිනේ තේ වතුකරය මධ්‍යයේ පිහිටි නුවරඑලිය දිස්ත්‍රික්කයට ගෙන යන ලදි. ගුරුවරුන් තිදෙනෙක් හා සිසුන් දෙදෙනෙක් අත් අඩංගුවට ගෙන ඇත. ඔවුහු සියල්ලෝ ම දෙමල ජාතිකයෝ ය. මාඕවාදී නව ප්‍රජාතන්ත්‍ර පෙරමුනේ (එන්ඩීඑෆ්) සාමාජිකයන් වන ඔවුහු එල්ටීටීඊයෙන් ආයුධ පුහුනුව ලබා ගත් බවට චෝදනාවට ලක්ව ඇත.

දුම්රිය කම්කරු එකතුවේ හා දුම්රිය වෘත්තීය සමිති සම්මේලනයේ සභාපති වන සරත් කුමාර ප්‍රනාන්දු පොලීසියට භාර වී ඇති අතර ඔහු දැනට බූස්ස රැඳවුම් මධ්‍යස්ථානයේ රඳවා ගෙන සිටී. කුමන්ත්‍රනයේ හවුල්කරුවකු බවට චෝදනාවට ලක්ව ඇති ප්‍රියන්ත නිහාල් ගුනරත්න රත්නපුර පොලීසිය විසින් පෙබරවාරි 13 දා අත් අඩංගුවට ගන්නා ලදි. ඔහු සිය අත් දෙකෙන් එල්ලීමෙන් වධ බන්ධනයට ලක් කොට ඇති අතර එහි ප්‍රතිඵලයක් ලෙස ඔහුගේ වලලුකරට තුවාල සිදු වී තිබේ.

පෙබරවාරි 17 දා සිට මේ දක්වා, වතු ගනනාවක වටලා සිදු කෙරුනු සෝදිසි මෙහෙයුම්වල දී පොලීසිය දෙමල කම්කරුවන් හා තරුනයන් 400ක් පමන අත් අඩංගුවට ගෙන ප්‍රශ්න කර ඇත. ඇත්ත වසයෙන් ම, ඉන් 109ක් බූස්සේ රැඳවුම් කඳවුරට යවා ඇති අතර තරුනයන් 30 දෙනෙක් විවිධ පොලිස් ස්ථානවල රඳවා ගෙන සිටී. මෙම දඩයක්කාරී මෙහෙයුම් සිදු කරනු පිනිස අමතර පොලිස් භටයන් හා සොල්දාදුවන් කැඳවන ලදි. මෙලෙස අත් අඩංගුවට ගත් අයගෙන් සමහරෙක් ඉහල කොත්මලේ ජල විදුලි බලාගාර ව්‍යාපෘතියට විරුද්ධව උද්ඝෝෂනවලට සහභාගි වූවන් වන අතර පොලීසිය දැන් මෙම විරෝධතා උද්ඝෝෂනය ගැන සිය අවධානය යොමු කර තිබේ.

දෙමල කතා කරන වතු කම්කරුවන් ඉලක්ක කිරීම අහම්බයක් නොවේ. ලක්ෂ පහක් පමන තේ හා රබර් වතු කම්කරුවෝ, බොහෝ ස්ථානවල දී සිය වෘත්තීය සමිතිවල ඉල්ලීම නොතකා, වැඩි වැටුප් ඉල්ලා පසු ගිය දෙසැම්බරයේ දී සති දෙකක වර්ජනයක නිරත වූහ. සෙසු කම්කරු කොටස් අතරින් මීට සමාන ඉල්ලීම් මතු වීම වලකාලීමේ මංමුලා සහගත ප්‍රයත්නයක යෙදී සිටි ආන්ඩුව මෙම වර්ජනය මගින් අර්බුදයකට ලක්

විය. වර්ජනය "වතුකරයට එල්ටීටීඊ ත්‍රස්තවාදීන් විනිවිදීමේ" තර්ජනය මතු කරන බවට රාජපක්ෂ ප්‍රකෝපකාරී ලෙස ප්‍රකාශ කලේ ය.

ඊට සමාන නරුම ආකාරයකින් මාර්තු 1 දා නිවේදනයක් නිකුත් කල ආරක්ෂක අමාත්‍යංශය ප්‍රකාශ කලේ," ජාතික ආරක්ෂාවට තර්ජනය කරන ක්‍රියාකාරකම්වල සෘජුව හෝ වක්‍රව යෙදෙන" ඕනෑම පුද්ගලයකු අත් අඩංගුවට ගෙන ප්‍රශ්න කිරීමේ අයිතිය "නීතිය බලාත්මක කරන බලධාරීන්ට" පවතින බව යි. හිතුවක්කාරී අත් අඩංගුවට ගැනීම්වලට, අතුරුදහන්වීම්වලට හා ප්‍රජාතන්ත්‍ර අයිතීන් උල්ලංඝනය කිරීම්වලට එරෙහිව විරෝධය දක්වන අය විශේෂයෙන් ම මෙම නිවේදනය මගින් ඉලක්ක කර ගැනුනි. "පුද්ගලයන් අත් අඩංගුවට ගැනීමෙන් ඉක්බිතිව ආරම්භ කෙරෙන විරෝධතා හා බලපෑම් පරීක්ෂනවලට බාධා පමුනුවනවා පමනක් නොව, ආන්ඩුවේ ස්ථාවරත්වයට ද තර්ජනය කරයි" යනුවෙන් එය අවධාරනය කලේ ය.

"ආන්ඩුවේ ස්ථාවරත්වයට තර්ජනය කරන" නීති යුක්ත භාවයකින් තොර පියවර ලෙස විරෝධතා ව්‍යාපාරවලට පහර ගැසීම මගින්, එම නිවේදනය ඕනෑම හා සියලුම දේශපාලන විරුද්ධවාදීන්ට එරෙහිව මහා පරිමාන ප්‍රහාරයක් සඳහා දොර විවෘත කරයි. රාජපක්ෂ ආන්ඩුව දැනටමත් ගැඹුරු දේශපාලන අර්බුදයක ගිලී පවතී. අතිශයින් ම අස්ථාවර පාර්ලිමේන්තු සභාගයක් මත වාරු වන එය පිරිහෙන ජීවන මට්ටම් අරබයා වැඩ කරන ජනතාව වෙතින් එල්ල වන පලල් විරෝධයකට මුහුන දී සිටී. සමාජ අර්බුදය විසඳලීමෙහි අපොහොසත්ව ඇති රාජපක්ෂ වැඩ කරන ජනතාව වාර්ගික රේඛා ඔස්සේ භේද කරනු පිනිස සිංහල ස්වෝත්තමවාදය ඇවිලවීමේ සහ එල්ටීටීඊයට එරෙහි යුද්ධය උත්සන්න කිරීමේ හිතාමතාම යෙදී සිටී. වඩ වඩා හුදකලාවට හා ඉරිතැලීම්වලට ලක්ව ඇති ආන්ඩුව දැන් සූදානම් වන්නේ පොලිස් රාජ්‍යයකට සමාන වන පාලනයක් බලාත්කාරයෙන් පැටවීම සඳහා කඩතුරාව ලෙස "ජාතික ආරක්ෂාව" යොදා ගැනීමට යි.

## රාජ්‍ය ත්‍රස්තවාදයේ ඉතිහාසයක්

ශ්‍රී ලංකාවේ ආන්ඩුව මෙවන් ක්‍රමවේදයන් යොදා ගත් පලමු වතාව මෙය නොවේ. 1989-1990 කාල වකවානුවේ දී ජවිපෙ මැඩීමේ නාමයෙන් එක්සත් ජාතික පක්ෂ ආන්ඩුව විසින් දිවයිනේ දකුනේ ගම්බද තරුනයන්ට එරෙහිව මර්දන රැල්ලක් මුදා හරින ලදි. ආරක්ෂක හමුදාවන් සහ ඔවුන්ගේ සහායක ඝාතන කල්ලි එක්ව 60,000ක් තරුන ජනයා එක්කෝ ඝාතනය කලහ, නැතිනම් "අතුරුදහන්" කලහ.

2002 සටන් විරාම ගිවිසුම අත්සන් කිරීමට පෙර කාල පරිච්ඡේදයේ දී පීටීඒ යටතේ දසදහස් සංඛ්‍යාත දෙමල ජනයා වටලා අල්ලා ගනිමින් නඩු විභාගයකින් තොරව වසර ගනන් නොවේ නම් මාස ගනන් රඳවා තැබූ අතර සමහර අවස්ථාවල දී ඔවුන් බරපතල වධ හිංසාවන්ට ලක් කෙරුනි. ජනාධිපති මහින්ද රාජපක්ෂ 2005 ජනාධිපතිවරනයෙන් ජයගෙන වැඩ භාර ගැනීමෙන් අනතුරුව ආරක්ෂක හමුදාවෝ නැවතත් මෙය ක්‍රියාවට නැංවූහ. මිලිටරිය සහ එහි සහායක සන්නද්ධ කන්ඩායම් විසින් මාස ගනනාවක් පුරා එල්ටීටීඊයට, දෙමල ජාතික සන්ධානයේ ප්‍රමුඛ පුද්ගලයින්ට සහ සමස්තයක් ලෙස සුලුතර දෙමල ජනයාට එරෙහි ප්‍රකෝපකරනයන්ගෙන් යුක්ත නීච සහගත යුද්ධයක් ගෙන ගියහ. පැහැර ගැනීම්, අතුරුදහන් කිරීම් සහ සැක සහිත ඝාතනයන් නැවත වරක් දෛනික ජීවිතයට අවතීර්න විය. පසු ගිය ජූලි මාසයේ දී 2002 සටන් විරාම ගිවිසුම විවෘතවම උල්ලංඝනය කරමින් ප්‍රහාරයකට යන ලෙස රාජපක්ෂ මිලිටරියට අන දුන් අතර එල්ටීටීඊ පාලන ප්‍රදේශයට අයත් මාවිල්ආරු, සාම්පූර් සහ වාහරෙයි යන ප්‍රදේශ හමුදාව විසින් අල්ලා ගැනින.

එල්ටීටීඊයට එරෙහි යුද්ධය සඳහා රාජපක්ෂගේ හැරී ගැනීම, දෙමල සුලුතරයට, මාධ්‍යයන්ට සහ දේශපාලන විරුද්ධවාදීන්ට එරෙහිව එල්ල වූ වඩ වඩාත් තීව්‍ර කෙරුනු ප්‍රජාතන්ත්‍ර විරෝධී පියවරයන් සමග ඒකාබද්ධ විය. නොනවත්වා සිදු කෙරෙන පැහැර ගැනීම් සහ ඝාතන ශ්‍රී ලංකාව තුල ද ජාත්‍යන්තරව ද එයට එරෙහි විරෝධතා රැල්ලක් අවුලුවාලී ය. 2006 අගොස්තු මුල දී ශ්‍රී ලංකාවේ නැගෙනහිර පලාතේ පැවති සටන් මධ්‍යයේ ප්‍රංශය පදනම් කර ගත් ඇක්ෂන් කොන්ට්‍රෙ ලා ෆාම් (ඒසීඑෆ්) නම් වූ සංවිධානයට අයත් සහන සේවකයින් 17 දෙනෙකුගේ වෙඩි තබා ඝාතනය කෙරුනු මල සිරුරු මුත්තූර්හි පිහිටි එම සංවිධාන සංකීර්නය අසල දී සොයා ගැනින. සටන් විරාමය අධීක්ෂනය කරන ශ්‍රී ලංකා සටන් විරාම නිරීක්ෂන කමිටුව තමා විසින්ම ගෙන යන ලද පරීක්ෂනයකින් අනතුරුව ඝාතනයන් සඳහා මිලිටරිය වගකිව යුතු යැයි අගෝස්තු 30 දා නිවේදනය කලේ ය.

මුල්ලිපොතානේ තම නිවසේ දී වෙඩි තබා ඝාතනය කරන ලද සසප ආධාරකරු සිවප්‍රගාසම් මරියදාස්ගේ ඝාතකයන් අල්ලා ඔවුනට විරුද්ධව නඩු අසා දඩුවම් පමුනුවන ලෙස ඉල්ලා ශ්‍රී ලංකාව තුල ද ලෝක *සමාජවාදී වෙබ් අඩවිය* හරහා ද සසප තමාගේම උද්ඝෝෂනයක් ගෙන යමින් සිටී. අද වන විට ලැබී ඇති සියලු සාක්ෂ්‍ය අනුව පෙනී යන්නේ ඔහු ඝාතනය කොට ඇත්තේ ශ්‍රී ලංකාවේ මිලිටරිය, පොලීසිය හෝ ඔවුනගේ සහායක සන්නද්ධ කන්ඩායම් විසින් බව යි. අමු අමුවේ සිදු කෙරෙන මෙවන් ඝාතන පිලිබඳ කවර හෝ බැරෑරුම් පරීක්ෂනයක් පොලීසිය විසින් මෙතෙක් පවත්වා නොමැත.

සේරසිංහ, සෙනවිරත්න සහ ප්‍රියංකර යන අයගේ රඳවා තැබීම සහ ඔවුනගේ "පාපොච්චාරනයන්" පැමිනියේ රාජපක්ෂ ආන්ඩුවට සහ මිලිටරියට අවශ්‍ය කෙරී තිබූ සුවිශේෂී මොහොතක ය. සිය ගනනක් වූ ඝාතන සහ පැහැර ගැනීම් පිලිබඳව පරීක්ෂන පවත්වන ලෙස රට තුලත් ජාත්‍යන්තරවත් කෙරෙන ඉල්ලීම් අපගමනය කිරීමේ උවමනාවෙන් ආන්ඩුව සහ මිලිටරිය දැඩිව පෙලෙයි. වසරකටත් වැඩි කාලයක් ගතවී ඇතත් මෙතෙක් පොලීසිය විසින් එක් පුද්ගලයකු හෝ අත් අඩංගුවට ගෙන හෝ නඩු පවරා හෝ නොමැත.

ආන්ඩුවේ ගැඹුරු කෙරෙන රාජ්‍ය මර්දනයට විරුද්ධ වන ලෙස ශ්‍රී ලංකාවේ කම්කරු පන්තියේ සියලු ම කොටස්වලින් -- සිංහල, දෙමල හා මුස්ලිම් -- සසප ඉල්ලා සිටී. සියලු දේශපාලන සිරුකරුවන් නිදහස් කරන ලෙසත් පීටීඒ හා හදිසි නීති බලතල ඇතුලු සියලු ප්‍රජාතන්ත්‍ර විරෝධී හා වෙනස්කම් කිරීමේ අන පනත් අහෝසි කරන ලෙසත් අපි ඉල්ලා සිටිමු.

යුද්ධයට, සමාජ අසමානතාවට හා ප්‍රජාතන්ත්‍ර අයිතීන්ට එරෙහි ප්‍රහාරයන්ට විරුද්ධ ඕනෑම අව්‍යාජ අරගලයක් සඳහා ආරම්භක ලක්ෂ්‍යය වන්නේ, ශ්‍රී ලංකා රාජ්‍යයේ සිංහල ස්වෝත්තමවාදය වේවා එල්ටීටීඊයේ දෙමල බෙදුම්වාදය වේවා ස්වෝත්තමවාදයේ හා වර්ගෝත්තමවාදයේ සියලුම රූපාකාරයන් ප්‍රතික්ෂේප කිරීම යි. සිය පාලනය පවත්වා ගෙන යනු වස් අඩ සිය වසකටත් අධික කාලයක් තිස්සේ වර්ගවාදය ගසා කා ඇති විවිධ පාලක ප්‍රභූන්ගේ අවශ්‍යතාවන්ට හා උත්සුකතාවන්ට මුලුමනින් ම විරුද්ධ පොදු පන්ති අවශ්‍යතාවන් හා උත්සුකතාවන් සියලු ම කම්කරුවන් පොදුවේ බෙදා හදා ගන්නා බව ඔවුන් අවබෝධ කර ගන්නා තාක් කල් කම්කරු පන්තියට එකදු පියවරක් වත් ඉදිරියට තැබිය නොහැකි ය.

සියලු ම සංස්ථාපිත පක්ෂවලින් ස්වාධීන වූ ද සමාජවාදී හා ජාත්‍යන්තරවාදී ප්‍රතිපත්ති මත පාදක වූ ද කම්කරු පන්තියේ හා පීඩිත ජනතාවගේ දේශපාලන ව්‍යාපාරයක් ගොඩනැගීම සඳහා සසප කැඳවුම් කර සිටී. එවන් ව්‍යාපාරයක්, දශක තුනක් තිස්සේ මුලුමනින් ම පාහේ මිලිටරි වාඩිලෑමකට යටත් කෙරී පවත්නා උතුරෙන් හා නැගෙනහිරෙන් සියලු ආරක්ෂක හමුදාවන් වහාම ඉවත් කරන ලෙස ඉල්ලා සිටිය යුතු ය. කම්කරු-ගොවි ආන්ඩුවක් ද දකුනු ආසියාවේ හා ජාත්‍යන්තරව සමාජවාදී සමූහාන්ඩු සංගමයක කොටසක් ලෙස ශ්‍රී ලංකා-ඊලම් සමාජවාදී සමූහාන්ඩුවක් ද ගොඩනගනු පිනිස එය සටන් වැදිය යුතු ය.

අන් සියල්ලට මත් වඩා කම්කරුවන්ගෙන් හා තරුන ජනයාගෙන් සසප ඉල්ලා සිටින්නේ, *ලෝක සමාජවාදී වෙබ් අඩවියෙන්* දිනපතා ඉදිරිපත් කෙරෙන අපගේ ජාත්‍යන්තර පක්ෂය වන හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ විශ්ලේෂන හා ක්‍රියාමාර්ගය අධ්‍යයනය කොට එයට බැඳීමේ තීන්දුව ගන්නා ලෙස යි.

© www.wsws.org